# රතු මල



ඩී.ජී. සවෙත්මි සිතුම්සා නයනදිනි ගුණසේකර

# රතු මල

ඩී.පී. සවෙත්මි සිතුමිසා නයනදිනි ගුණසේකර

**රතු මල**

ඩී.ජී. සවෙත්මි සිතුම්සා නයනදිනි ගුණසේකර
මහාමායා බාලිකා විදුහල
මහනුවර

ISBN - 978-624-208-260 -2

**කතෘගේ වෙනත් කෘති**

1. හා පැංචාගෙන් අපූරු පාඩමක්
   ISBN - 978-624-206-732-2

2. උංගා
   ISBN - 978-624-208-457-2

# පිදුම

මා ඉගෙනුම ලබන

මහාමායා බාලිකා විදුහලේ

විදුහල්තිතුමිය ඇතුළු

ගුරු මෑණිවරුන් සහ

ගුරුපියවරුන් ඇතුළු

මාගේ පංති භාර ගුරුතුමිය සහ

මාගේ මිතුරියන් හට සහ

මාගේ දෙමාපියන් දෙපලට

මාගේ නැගනියට

මේ පොත් පිංච

ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵළයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අඳුරු රාත්‍රියක එක පාරටම විදුලි
ආලෝකයක් මගේ ජනේලය
ළඟට ඇවිත් නැති වී ගියේය.
මම හොඳින් ඇස්
ඇර ජනේලය විවර
කර බැලුවෙමි.



ඒත් සමගම අම්මා මාගේ ළඟට විත් මට කතා කළේය. මම බියට පත්වී අම්මා ඇසූ දෙයට විනාඩි කිහිපයකට පසු පිළිතුරු දුන්නෙමි.

ඇයි දරුවෝ ඔයා බයවෙලා . අම්මා මගෙන් ඇසුවේ ය.


නෑ නෑ අම්මේ මම බය වුණේ නෑ. මම හීන් හඬින් පිළිතුරු දුන්නෙමි.

නැවත උදෑසන මම ජනේලය විවර කර බැලුවෙමි. අමුතු රතුපාට මලක් මම දුටුවෙමි.



මම රතු මල අතගෑවා පමණි මට මතක. මා ඇස් ඇර බලන විට, මැ දැන් සිටින්නේ අමුතු ලෝකයකය. එකවරම මම මහා හයියෙන් කෑ ගැසුවෙමි. මම මේ කොහෙද ඉන්නේ . කව්ද ඔතන ගහ යට ඉන්නේ කව්ද?... කව්ද?





එක පාරටම අමුතු පුංචි පුංචි මල් වල හැඩ ගත්ත සුරංගනාවියෝ මම දුටුවෙමි. මම බියට පත්ව තව සැරයක් මහ හඬින් කැ ගැසුවෙමි.

බය වෙන්න එපා පුංචි ළමයෝ අපි තමයි මේ මල් වලට , පරිසරයට ආදරය කරන සුරංගනාවියෝ.

මම පුදුම විය. අනේ මම හොඳටම පුංචි වෙලා.

මම මොකක්ද කරපු වැරැද්ද?

ඔයා හොඳට කල්පනා කරන්න දරුවෝ යැයි
කහපාට මලක හැඩය ගත් සුරංගනාවියක් මට
ලං වෙලා ඇහුවා.





මම මල්වල පෙති නිකරුණේ කඩලා දානවා. මල්ගස් වලට හිරිහැර කරනවා. අනේ මට සමාවෙන්න මම ආයෙ එහෙම කරන්නේ නෑ.



කමක් නෑ පුංචි දරුවෝ ඔයා හොඳ ළමයෙක්. අපි ඒක දන්නවා. ඔයා නැවත අපිට කරදර කරන්න එපා.



එන්නකෝ ඔයාට අපේ මල් ලෝකය පෙන්වන්න යැයි පවසා මාව රැගෙන ඉහළ අහසට ගෙන ගියා.

මගේ ඇස් අදහා ගත නොහැකිවිය. ලස්සන මල් ගොඩයි. සමනලයින් පුංචි පුංචි කුඩා සතුන් ඒ මල්වලින් පැණී බොනවා. මම මෙච්චර දවසක් හිරහැර කළේ මේ ගස්වලට නේද කියලා මටම මම කියාගෙන දුක්වුණා.



මම සුරංගනාවියන්ට පොරොන්දු වුණා කිසිම දවසක මල් වලට කරදර කරන්නෑ කියලා. මම නැවතත් ගෙදර පැමිණියා.

ඉතින් අපි හැමෝම සතුන්ට, ගස්, වැල් මල් වලට ආදරය කරමු.

මේවා වලද අපි නොදකින ලෝකයක් ඇත.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්